**වසංගත රෝග විද්‍යා අංශය**
**සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය**
**231, ද සේරම් පෙදෙස, කොළඹ 10.**
දුර: (+94 11) 2695112 ෆැක්ස්: (+94 11) 2696583 වෙබ්: www.epid.gov.lk

# 2019 - nCoV
# තොරතුරු පත්‍රිකාව

## 2019 නව කොරෝනා වෛරස ආසාදනය

චීනයේ වූහාන් නගරයෙන් මුල්වරට මතුවී රට තුළ වසංගත රෝග තත්වයක් බිහිකළ 2019 නව කොරෝනා වෛරසය කලින් මුහුදු ආහාර, සත්ව ආහාර සම්බන්ධව වැඩකරන අය අතර පැතිර ගිය බවට පෙනී ගියත් රෝගීන් වාර්තාගත වීම අනුව පුද්ගලයාගෙන් පුද්ගලයාට පැතිරෙන බවට සනාථ වී ඇත.

## රෝග කාරකය

මෙය මතුවී ගෙන එන වෛරස රෝගයකි. එය සාමාන්‍ය ප්‍රතිශ්‍යාව සාදන, තීව්‍ර ශ්වසන ආසාදනය සාදන, මැද පෙරදිග ශ්වසන රෝගය සෑදූ වෛරස් පවුලට සම්බන්ධ වේ.

## බෝවෙන ක්‍රම

රෝගී පුද්ගලයෙකුගෙන් තව නිරෝගී පුද්ගලයෙකුට සමීප ඇසුරකින්, රෝගී පුද්ගලයා කහින විට, කිවිසින විට වාතය හරහා එන කෙළ බිඳිති මගින් මෙම රෝගය බෝවිය හැක.

රෝගය එක් පුද්ගලයෙකුගෙන් තව කෙනෙකුට බෝවීමට ගතවන වාර්තාගත කාලය දින 2 සිට 14 දක්වා වේ.

## රෝග ලක්ෂණ

රෝග ලක්ෂණ සුළු සහ තීව්‍ර අවස්ථා ලෙසට වාර්තා වී ඇත. දියවැඩියාව, කාලීන ශ්වසන රෝග, වකුගඩු රෝග තිබෙන පුද්ගලයන් සඳහා වැඩි අවදානමක් ඇත.

උණ, උගුරේ ආසාදනය, කැස්ස, ශ්වසන අපහසුව බහුලව පවතින රෝග ලක්ෂණ වන අතර නියුමෝනියාව, තීව්‍ර රෝග ආසාදනය, වකුගඩු තීව්‍ර ආසාදනය සහ මරණය තීව්‍ර ආසාදන ලෙසට වාර්තා වී ඇත.

## රෝග පරීක්ෂාව

2019 නව කොරෝනා වෛරසය PCR පරීක්ෂණය මගින් රසායනාගාර තුළදී හඳුනා ගත හැක. මෙම පරීක්ෂණ සඳහා ශ්වසන පද්ධතියේ ශ්‍රාවයන් පරීක්ෂාවට ගනු ලැබේ.

## ප්‍රතිකාරය

දැනට වෛරසය සඳහා වෛරස නාශක ඖෂධ නොමැති අතර නව වෛරසයක් බැවින් එන්නතක් ද නිපදවා නැත. රෝගියාගේ රෝග ලක්ෂණ මත ප්‍රතිකාර කරනු ලැබේ.

## වළක්වා ගැනීම

ශ්වසන රෝග සඳහා භාවිතා කරන වළක්වාගන්නා ක්‍රමවේදයන් මෙම රෝගය සඳහා ද පිළිපැදිය හැක. ලෝක සෞඛ්‍ය සංවිධානයේ පිලිගැනීම මත, පහත සඳහන් රෝග වළක්වන ක්‍රමවේදයන් ඉදිරිපත් කරනු ලැබේ.

1. නිතරම තම දෙඅත් සබන් ගා සෝදා ගත යුතු අතර මෙය පොදු ස්ථානයක සිටී නම් කළ යුතුමය. සබන් වෙනුවට දෙඅත් පිරිසිදු කරගත හැකි වෙන ආදේශක ද්‍රාවණයක් වුවද භාවිතයට ගත හැක.
2. කහින විට සහ කිවිසින විට ලේන්සුවක් හෝ ටිෂූ කඩදාසියක් මුව සහ නාසය වසා ගැනීම සඳහා භාවිතා කළ යුතුය. ටිෂූ කඩදාසි භාවිතයෙන් පසු ක්‍රමානුකූලව ඉවත දැමිය යුතුය. කහින විට සහ කිවිසින විට වැලමිට නවා මුව සහ නහය ආවරණය වන පරිදි එය සිදුකළ යුතුය.
3. සෑම විටම ශ්වසන රෝගීන් ඇසුරින් ඈත්වී සිටිය යුතු අතර පොදු ස්ථානවල නිකරුණේ ගැවසීමෙන් වැළකිය යුතුය.
4. ශ්වසන රෝග ලක්ෂණ පහල වූයේ නම් වහාම සුදුසුකම්ලත් වෛද්‍යවරයෙක් හමුවී ප්‍රතිකාර ලබා ගත යුතුය.
5. මස් මාළු ආහාරයට ගන්නා විට හොඳින් පිස ආහාරයට ගත යුතුය.
6. වනසතුන් ගෙන්, සත්ව ගොවිපල වල වැඩකරනු ලබන්නේ නම් රෝගී සත්වයින්ගෙන් ඈත් වී සිටිය යුතුය. මියගිය සතුන් පරිභෝජනයට නොගත යුතුය.